# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.09.28<br>පැය 1930 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/1807/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

**නීති විරෝධීව මොටර් රථයක් එකලස් කර කූඨ ලේඛණ භාවිතා කර ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.**

2025.09.28 වන අද දින සවස් කාලයේදී නීති විරෝධී ලෙස එකලස් කරමින් කූඨ ලේඛණ භාවිතා කර ව්‍යාජ ලෙස ලියාපදිංචි කල ජීප් රථයක් පුද්ගලයෙකු විසින් භාවිතා කිරීමට සූදානම් කිරීම සම්බන්ධයෙන් වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත විමර්ශනයක් සිදු කර එම රථය සහ අදාල පුද්ගලයා අත්අඩංගුවට ගෙන පින්වත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 57 ක් වන පින්වත්ත, පානදුර ප්‍රදේශයේ පදිංචි හිටපු බස්නාහිර පළාත් මන්ත්‍රීවරයෙකු වූ වර්ථමාන දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වේ.**

තවද, මෙම ඒකකයේ නිලධාරීන් විසින් ඉහත සැකකරු සන්තකයේ තිබී නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද ව්‍යාජ අංක යටතේ ලියාපදිංචි කරන ලද ජීප් රථයක් 2024.12.31 වන දින අත්අඩංගුවට ගෙන තිබිණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විරමර්ශනයේදී නීති විරෝධි ලෙස මෙරටට ගෙන්වන ලද තවත් වාහන දෙකක් සම්බන්ධයෙන් අනාවරණය වූ තොරතුරු මත 2025.01.01 වන දින එම වාහන දෙකද පොලිස් භාරයට ගෙන පින්වත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. මෙම වාහන නීති විරෝධී ලෙස එකලස් කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

මෙම අත්අඩංගුවට ගන්නා ලද වාහන තුන සම්බන්ධයෙන් පානදුර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පවත්වාගෙන යන අතර අද දින අත්අඩංගුවට ගන්නා ලද ජීප් රථය මෝටර් රථ පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කර එය ව්‍යාජ ලෙස එකලස් කල වාහනයක් බවට හා ධාවනයට නොසුදුසු රථයක් බවට වාර්තා කර ඇත. ඒ අනුව ඉහත ජීප් රථය සහ සැකකරු 2025.09.29 වන දින ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

මෙම අත්අඩංගුවට ගැනීම් මෝටර් වාහන පනතේ 19 (01) වගන්ති ප්‍රකාරව සිදු කර ඇත. වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**